පෙබරවාරි 25 , 2011

# ගංවතුරින් අවතැන්වූවන්ට ජපානයෙන් ආධාර

ගංවතුරින් විපතට පත්වූ ශ්‍රී ලාංකික ජනතාව සඳහා ජපන් රජයෙන් ඇ. ඩො මිලියන 1.2 අමතර සහනාධාර, ජාත්‍යාන්තර සංවිධාන කිහිපයක් හරහා ලබාදෙන ලදී. මේ අනුව අවතැන් වූවන් වෙනුවෙන් ඇ. ඩො 700,000 (රු. මිලියන 77 පමණ) සහන සැලසීම සහ කඩිනම් ප්‍රතිසංස්කරණ සඳහා ලෝක ආහාර වැඩසටහනටද , ඇ. ඩො 300,000 (රු මිලියන 33 පමණ) පිරිසිදු ජලය හා සනීපාරක්ෂක කට්ටල සැපයීම සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලටද , ඇ.ඩො 200,000 (රු මිලියන 22 පමණ) කූඩාරම් සැපයීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස සම්මේලනය / ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානයටද ලබාදෙන ලදී.

ගංවතුරින් විපතට පත්වූ අය වෙනුවෙන් ලබාදුන් මානුෂික ආධාර හා ඒ ප්‍රදේශයන් පිළිසකර කිරීමට ශ්‍රී ලංකා රජයෙන් ගෙනගිය වැඩපිළිවෙල පිළිබඳව තමන් බොහෝ සේ පැහැදී සිටින බව ජපන් තානාපති කුනියෝ ටකහෂි මහතා ප්‍රකාශ කළේය. ජපන් රජයෙන් ලබාදුන් සහනාධාර ගංවතුරින් පීඩාවට පත්වූ ජනතාවට හා ඒ ඒ ප්‍රදේශ පිළිසකර කිරීමට අමතර පිටිවහලක් වනු ඇතැයි තමන් බලාපොරොත්තු වන බවද ඒ මහතා තවදුරටත් සඳහන් කළේය.

ජපන් රජයෙන් ගංවතුරින් විපතට පත්වූ ජනතාවගේ හදිසි අවශ්‍යතා සඳහා ඇ. ඩො 240,000 ( රු මිලියන 27 පමණ) වටිනා කූඩාරම් 280ක් හා මෙට්ට 1,500 ජනවාරි 14 වන දින ලබාදී ඇත . මීට අමතරව පෙබරවාරි 2 වන දින ජපන් රාජ්‍ය නොවන සංවිධාන 5 ක් හරහා ඇ.ඩො 570,000 (රු මිලියන 63 පමණ) ආහාරපාන හා අනිකුත් දෑ ලබාදීම සඳහා , ගංවතුරට යටවූ ප්‍රදේශ වල ළිං පිරිසිදු කිරීමටත් , අධ්‍යාපන පහසුකම් පිළිසකර කිරීම සඳහාත් ජපන් රජයෙන් ලබාදෙන ලදී.

සමස්තයක් වශයෙන් ගත්කල ජනවාරි හා පෙබරවාරි මාසයන්හි ජපන් රජයෙන් ඇ.ඩො මිලියන 2 ක් (රු මිලියන 220 ක් පමණ) මානුෂික ආධාර වශයෙන් ගංවතුරින් පීඩාවට පත්වූවන් හට ලබාදෙන ලදී. මෙම ආධාර පීඩාවට ලක්වූ ජනතාවගේ සුභසාධනය සඳහා ඉතා ඵලදායී ලෙස යොදවනු ඇතැයිද පීඩාවට පත්වූ ප්‍රදේශ ඉතා ඉක්මනින් යථා තත්වයට පත්වනු ඇතැයි ජපන් රජයේ අපේක්ෂාවයි.